## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල - 2013

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනතේ 7(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2. <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3. <u>විගණකගේ වගකීම.</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4. <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම.</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන.</u>

2.1. <u>තත්ත්වාගණනය කළ මතය.</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

2.2.1. <u>ගිණුම්කරණ අඩුපාඩු.</u>

බෝගම්බර බන්ධනාගාරය විසින් සිරකරු ශ්‍රමය සැපයීම වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් අරමුදලට ලැබිය යුතු රු.2,951,200 ක මුදලින් රු.176,600 ක් සමාලෝචිත වර්ෂය තුළදී බන්ධනාගාර ගිණුමට ලැබී තිබුනද එය අරමුදලේ ගිණුම්වලට මාරු කර නොතිබුණි.

2.3 <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.</u>

අරමුදලේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අංක 842 හා 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.4. <u>නොසැසඳූ පාලන ගිණුම්.</u>

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සිරකරු සුභසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල පරිත්‍යාග ලැබීම් සාරාංශයට අනුව සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලැබීම් දළපොත බන්ධනාගාරය රු.245,050 ක් සහ ත්‍රිකුණාමලය බන්ධනාගාරය රු.124,449 ක් වන නමුත් සිරකරු සුභසාධක අරමුදලේ සවිස්තරාත්මක පරිත්‍යාග වත්කම් ලැබීම් ලේඛනයට අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.13,800 ක් සහ රු.134,529 ක් වීමෙන් රු.241,330 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ කේවල ගිණුමට අනුව සිරකරුවන්ගේ අධ්‍යාපනික හා ආගමික වියදම් රු.10,000 ක් සහ ක්‍රීඩා හා වෙනත් පහසුකම් වියදම් රු.24,415 ක් වුවද මූල්‍ය වාර්තාවල එම වියදම් පිළිවෙලින් රු.19,999 ක් සහ රු.14,416 ක් ලෙස දක්වා තිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය.</u>

3.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,307,314 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,144,613 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවයේ රු.162,701 ක වැඩිවීම සඳහා ආදායම් රු.201,547 කින් අඩුවී තිබීම සහ අරමුදලේ වියදම් රු.38,846 කින් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1. කාර්යසාධනය.

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.3,947,010 ක් වුවද සිරකරුවන්ගේ සුභසාධන කාර්යයන් සඳහා වැයකර තිබු මුදල රු.1,372,881 කි. මේ අනුව සිරකරුවන්ගේ ශුභ සාධනය සඳහා අරමුදලේ දායකත්වය අවම මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් උපදවා ඇති බන්ධනාගාර 07 ක් සඳහා ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

5.1. අයවැය ලේඛනමය පාලනය.

පහත සඳහන් කරුණු හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සිරකරු සුභසාධක අරමුදලේ ඇස්තමේන්තු හා තථ්‍ය ආදායම් වියදම් අතර සියයට 3 සිට සියයට145 දක්වා වූ පරාසයක විචලනයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සිරකරු සුභසාධන අරමුදල් ලැබීම් රු.3,893,005 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන් ලැබී තිබුණු මුදල රු.1,806,918 කි. ඒ අනුව ඇස්තමේන්තුගත ලැබීම් සහ තථ්‍ය ලැබීම් අතර වෙනස රු.2,086,087 ක් වේ. ඒ අනුව ලැබීම් සියයට 50 ට වැඩි අගයකින් පහත වැටී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ වියදම රු.3,740,800 ක් වුවද සිරකරු සුභසාධන කටයුතු සඳහා සත්‍ය වියදම රු.1,372,881 ක් වීමෙන් එය සියයට 63 ක් පමණ විය.

5.2. අභ්‍යන්තර විගණනය.

සිරකරු සුභසාධනය වෙනුවෙන් අරමුදලේ කාර්යයන්ට අදාල අභ්‍යන්තර විගණන වැඩසටහන් ප්‍රමාණවත් පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් අඩුපාඩු වරින්වර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය.

(ආ) අභ්‍යන්තර විගණනය.

(ඇ) අයවැය පාලනය.